www.agaram.lk

NALANDA VIDYALAYA
# නාලන්දා විද්‍යාලය - කොළඹ 10
පළමු වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 10 ශ්‍රේණිය | නර්තනය | කාලය : පැය 2 |
|---|---|---|

## 06 - නිර්දිෂ්ට ජන කවි ගායනා

- **ප්‍රශ්න අංක 01 සිට 31 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) 'සොබමන් දෙව්වරු සදෙනෙක් එතනට' මෙම කවි පදය අයත් වන්නේ,
1) කුළු කව්වලට ය. 2) පතුරු කව්වලට ය.
3) චාමර කව්වලට ය. 4) කළගෙඩි කව්වලට ය.

(2) 'අතකට ගෙන රබන් පොඩිය වයති දිසි රුවින්' මෙම කවිය ගායනා කරනු ලබන්නේ,
1) මහ තනි තිතට ය. 2) සුළු තනි තිතට ය.
3) මැදුම් තනි තිතට ය. 4) සුළු මැදුම් දෙතිතට ය.

(3) චාමර නර්තනයේ දී චාමර කවි සමග භාවිත කළ හැකි වෙනත් ගායන විශේෂයක් වන්නේ,
1) ඔන්චිලි වාරම් ය. 2) ටීකා සීපද ය. 3) සවුදම් ය. 4) ප්‍රශස්ති ය.

(4) 'රටකට මව් සමගින් එනැව් නැග යන කළ අපෙ මුනිඳුන්' මෙය අයත් වන්නේ,
1) ධීවර කව්වලට ය. 2) රබන් කව්වලට ය.
3) චාමර කව්වලට ය. 4) මල් යහන් කව්වලට ය.

(5) ඔන්චිලි වාරමක පද කොටසකි,
1) අපි දැන් දක්වමු ඒ රඟ සබයට
2) සුරපුර දෙවියන් රැක මෙ සියල්ලා
3) දැන් මෙමන් අතින් රැගෙන කරකවමි මනා
4) එදා ඒ බුදු බව පැතු මාතා හට

(6) 'පුරවර මැද බැඳි රන් ඔන්චිල්ලා' මෙම කවිය ගායනා කරනු ලබන්නේ,
1) සුළු තනි තිතට ය. 2) මැදුම් තනි තිතට ය.
3) මහ තනි තිතට ය. 4) සුළු මැදුම් දෙතිතට ය.

(7) අනාඛ්‍යානාත්මක ජන ගී විශේෂයක් ලෙස හැඳින්විය හැකිය.
1) වන්නම් කවි 2) ඔන්චිලි වාරම් 3) කළගෙඩි කවි 4) පැල් කවි

(8) 'අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්' මෙම කවියේ මීළඟ පදය කුමක් ද?
1) අහසේ සඳ සේ රන් තරු පිරිවර කැලුමෙන්
2) අහසට දමමින් අල්ලා රබාන දැතින්
3) ගත පිට බඳ සොලවා සිලි සිලි නද කරමින්
4) සිතකට වත් නොගෙන රඟති විදුලිය විලසින්

(9) 'අටදෙන අටකොණ වාඩිවෙයල්ලා' යනු,
1) වන්නම් කවියකි. 2) රබන් කවියකි. 3) ඔන්චිලි කවියකි. 4) ටීකා සී පදයකි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(10) 'මේරුං විරාජිත සමං විය බුද්ධ රාජං' යනු,
1) නමස්කාර ගාථාවකි.
2) ටීකා සී පදයකි.
3) රබන් කවියකි.
4) මල් යහන කවියකි.

(11) 'ඉඳ ගත්තෙමි උස පුටුවක ගුවනා' මෙම කවියේ මීළඟ පාදය කුමක් ද?
1) වැඳ ගත්තෙමි නාරායන සරණා
2) ඇඳ ගත්තෙමි වතකුත් ආභරණා
3) වැල් දෙක තෝරා අල්ලා අතිනා
4) බැඳ ගත්තෙමි ජය කොණ්ඩය මුදුනා

(12) 'ජය ජය සිංහ නරේන්ද්‍රා රක්ෂ රක්ෂ' මෙම කවිය යොදා ගත හැක්කේ,
1) තාලම් නැටුමට ය.
2) රබන් නැටුමට ය.
3) චාමර නැටුමට ය.
4) සවරම් නැටුමට ය.

(13) ඔන්චිලි වාරම් ගායනය සඳහා යොදා ගන්නේ,
1) විලම්භ ලයයි.
2) මධ්‍ය ලයයි.
3) ද්‍රැත ලයයි.
4) මධ්‍ය හා ද්‍රැත ලයයි.

(14) 'ටීකා සීපද' එනමින් හඳුන්වනු ලබන්නේ,
1) සී පදයෙහි අරුත ටීකාවෙන් පැහැදිලි කරන නිසාවෙනි.
2) සී පදයේ සෑම පාදයකට පෙර ටීකා පදයක් යෙදෙන නිසාවෙනි.
3) සී පද ගායනය මගින් හාස්‍ය රසය උපදින නිසාවෙනි.
4) විවිධ සමාජ තොරතුරු එමගින් කියැවෙන නිසාවෙනි.

(15) 'උන්තැන අටයි තරිකිට දොද් දොං තා'' යන ගී පාදය,
1) ටීකාවකට අදාළ කොටසකි.
2) සී පදයට අදාළ කොටසකි.
3) රබන් පදයක කොටසකි.
4) සවුදමකට අදාළ කොටසකි.

(16) 'ත්‍රිවිධ ඥාන විදුරු පඬි අපෙ මහ ගෞතම නම් මුනිඳු' යන ගී පාදය අයත් වන්නේ,
1) වන්නම් ගායනයට ය.
2) මල් යහන් ගායනයට ය.
3) තාලම් ගායනයට ය.
4) රබන් ගායනයට ය.

(17) භෞතික, අභෞතික, ජීවී, අජීවී, අතිමානුෂ ආදී කොට ඇති විවිධ ප්‍රස්තුත මාතෘකා කොට රචිත ගායනා විශේෂයක් වන්නේ,
1) ප්‍රශස්ති ගායනා
2) වන්නම් ගායනා
3) හටන් කවි
4) ග්‍රහ පන්ති කවි

(18) සෑම වන්නමක් සඳහාම නිශ්චිත වූ
1) නාද මාලාවක් ඇත.
2) කස්තිරමක් ඇත.
3) අඩව්වක් ඇත.
4) සීරුමාරුවක් ඇත.

(19) පහතරට වන්නම් මගින් වර්ණනාවට ප්‍රස්තුත කොට ගෙන ඇත්තේ,
1) කතරගම දෙවියන් ය.
2) පත්තිනි දෙවියන් ය.
3) නාථ දෙවියන් ය.
4) විෂ්ණු දෙවියන් ය.

(20) නමස්කාර ගායනා බහුල වශයෙන් රචනා කර ඇත්තේ,
1) පාලි භාෂාවෙනි.
2) සංස්කෘත භාෂාවෙනි.
3) සිංහල භාෂාවෙනි.
4) ප්‍රාකෘත භාෂාවෙනි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(21) ටීකා සීපදයක සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,
1) සී පද නාදමාලාවට අනුව ගායනා කිරීම.
2) සී පදයේ මුලට ටීකාවක් එක්කර තිබීම.
3) පදයෙන් පදය වෙන් වෙන්ව ගැයීම.
4) තාලානුකූලව ගායනා කිරීම.

(22) 'අර බලන්න ඉර ගිරවිගෙ පැටියෝ ' යන කවි පදය අයත් වන්නේ කුමකට ද?
1) කළගෙඩි කවි
2) ලී කෙළි කවි
3) ඔන්චිලි කවි
4) සීපද කවි

(23) ගමේ පොදු ස්ථානයක කතුරු ඔන්චිල්ලාවක් බැඳීමට ප්‍රථමයෙන් පඬුරු බැඳ බාරහාර වන්නේ කුමන දෙවියන් වෙනුවෙන් ද?
1) කතරගම දෙවියන්
2) විෂ්ණු දෙවියන්
3) පත්තිනි දෙවියන්
4) ගම්බාර දෙවියන්

(24) ' සම්මා සම්බුද්ධ ඥානේන - සම්මා සම්බුද්ධ දේශනා' යන ගාථාව අයත් වන්නේ,
1) නමස්කාර ගායනයට ය.
2) අෂ්ටක ගායනයට ය.
3) ශ්ලෝක ගායනයට ය.
4) යාදිනි ගායනයට ය.

(25) ටීකා සීපදයක ටීකා කොටසින් ගම්‍යමාන වන මූලික රසය වන්නේ,
1) අර්ථ රසයයි.
2) ශබ්ද රසයයි.
3) ව්‍යාංගාර්ථ රසයයි.
4) අනුප්‍රාස රසයයි.

(26) වන්නම් සහ රබන් කවි ගායනයේ දී ගුරු උපදේශනය සහ මග පෙන්වීම අවශ්‍ය වන්නේ,
1) තනිව ගායනය කළ නොහැකි නිසාය.
2) වාදනයට අනුව ගායනය කළ යුතු නිසාය.
3) සාම්ප්‍රදායික නාදමාලාවට අනුව ගායනය කළ යුතු නිසාය.
4) ගුරුවරයා වැඩිහිටියෙකු නිසාය.

(27) නමස්කාර ගායනා යනු,
1) අනාඝාතාත්මක ගායනා විශේෂයකි.
2) ආඝාතාත්මක බසින් රචිත ගායනා විශේෂයකි.
3) සංස්කෘත බසින් රචිත ගායනා විශේෂයකි.
4) ශෘංගාරාත්මක ගායනා විශේෂයකි.

(28) 'තවද උඟරන්ට මුවන්ට වෙඩි තියන්නට වල් පාරක් දිගේ ................' යනුවෙන් ගායනා කරන්නේ,
1) රබන් කවියකි.
2) ඔන්චිලි වාරමකි.
3) ටීකා සී පදයකි.
4) සබරගමු වන්නමකි.

(29) ටීකා සී පදයක 'සී පද' කොටස ගායනය කරන්නේ,
1) ආඝාතාත්මකව ය.
2) අනිෂ්ටිප් විරිතට ය.
3) අනාඝාතාත්මකව ය.
4) අනුප්‍රාසයෙන් යුක්තව ය.

(30) නූතනයේ දී ශාස්ත්‍රීය ගායනා විශේෂයක් ලෙස සැලකේ.
1) වන්නම් කවි
2) චාමර කවි
3) පාරු කවි
4) කරත්ත කවි



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

(31) ජන ගායනාවක් මගින් අනාවරණය වන්නේ,

1) ජනතාවගේ සමාජ අවශ්‍යතාවයන් ය.
2) ජනතාවගේ යුතුකම් හා වගකීම් ය.
3) ජනතාවගේ සමාජ සංස්කෘතික වගකීම ය.
4) ජනතාවගේ ක්‍රියාකාරකම් ය.

- **කෙටි පිළිතුරු සපයන්න.**

(32) මාත්‍රා 3 තනි තිතට ගායනය කළ හැකි රබන් කවියක් ලියන්න.

(33) රබන් හා වන්නම් කවිවල සංස්කෘතික පසුබිම කෙටියෙන් විස්තර කරන්න.

(34) මාත්‍රා 4 තනි තිතට ගායනය කළ හැකි චාමර කවියක් ලියන්න.

(35) ඔන්චිලි වාරම් කවියක් ලියන්න.

(36) ගද්‍ය හා පද්‍ය ලක්ෂණ මතු කරන කවි විශේෂයක් පිළිබඳ කෙටියෙන් හඳුන්වා එවැනි ලක්ෂණ පෙන්වන කවියක් ලියන්න.

(37) ඔන්චිලි වාරම් කවිවල සංස්කෘතික පසුබිම පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

(38) චාමර සහ නමස්කාර ගායනාවල සංස්කෘතික පසුබිම කෙටියෙන් සඳහන් කරන්න.

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk



agaram.lk